''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; I කලාපය; 2023 මාර්තු; පිටු: 89-96

# මහනුවර රාජධානි අවධියේ ස්ත්‍රී පාර්ශවය සතුවූ ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ විමසුමක්: සීට්ටු, ගම්පත්කඩ සහ පූජාපත්‍ර ඇසුරෙනි

**එම්. ඒ. ප්‍රසාද් කුමාර**
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
prasadmallawaarachchi85@gmail.com

**සංක්ෂේපය**

මහනුවර රාජධානි අවධියේ කාන්තාව සතු ඉඩම් අධිකාරි බලය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණය මගින් සිදු කෙරේ. මහනුවර රාජධානි සමයේ කාන්තාව සතු ඉඩම් අධිකාරි බලය පුරුෂයන් සතු ඉඩම් අධිකාරි බලය අභිබවා යාමක්ද? යන පර්යේෂණ ගැටලුව ඔස්සේ මෙම පර්යේෂණය දියත් කර ඇත. කාන්තාව සතු මහනුවර රාජධානි සමයේ හිමිවූ ඉඩම් අධිකාරි බලය විමසා බැලීම, ඉඩම් ප්‍රදානය කිරීම, මිළදී ගැනීම හා විකිණීම උදෙසා ඇය වෙත හිමිවූ බලය පිළිබඳ විමර්ශනය, ඉඩම් නඩු සම්බන්ධයෙන් කාන්තාවගේ මැදිහත් වීම හඳුනාගැනීම ආදිය මෙම පර්යේෂණයේ අරමුණු වේ. මෙම අධ්‍යයනයේදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර දත්ත ලබාගැනීමේදී පුස්තකාල අධ්‍යයනය හා සන්නස්, තුඩපත්, ගම්පත්‍ර රැසක් අධ්‍යයනයට ලක් කොට ලබාගත් දත්ත සන්සන්දනය හා විශ්ලේෂණය කරමින් නිගමනවලට එළඹී තිබේ. මෙම පර්යේෂණයේදී පෙනීගිය කරුණක් වූයේ රජරට හා නිරිතදිග රාජධානි සමයේ මෙන්ම මහනුවර රාජධානි සමයේදීත් ඉඩම් ප්‍රදානය කිරීම, මිළදී ගැනීම, විකිණීම, පැවරීම ආදී සෑම අවස්ථාවකදීම සැලකිය යුතු අධිකාරි බලයක් ඇය හිමි කරගත් බවයි. ඇතැම් විට එය පුරුෂයන් සතු ඉඩම් අධිකාරි බලයට පවා අභියෝග කිරීමට සමත් වූ බව පැහැදිලි විය. එනිසා මහනුවර රාජධානි සමයේ කාන්තාව ඉඩම් අධිකාරි බලය සම්බන්ධයෙන් පුරුෂයාට හිමි තත්ත්වයට සමාන හා ඇතැම් විට ඉඩම් නඩු වැනි අවස්ථාවලදී පුරුෂයන්ට අභියෝග කිරීමට පවා සමත් වූ බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද:** අධිකාරි බලය, අභියෝග, ඉඩම්, නඩු, මැදිහත්වීම

## හැඳින්වීම

අතීතයේ මෙන්ම වර්තමානයේත් තොටිල්ල පදවන හස්තය රාජ්‍ය දේශපාලන හා ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයේ නඟා සිටුවීම උදෙසා කරනු ලබන කාර්යභාරයේ වටිනාකම් සමකාලීන ලෝක සන්දර්භය තුළ ශ්‍රී ලාංකේය නාමය රඳවා තබා ගැනීමට බෙහෙවින් ඉවහල් වී තිබේ. ඇතැම් විටක සාම්ප්‍රදායික දෘෂ්ටියෙන් කාන්තාව කුටුම්භය තුළ පවරාගත් වගකීම් ඉටු කරනු ලබන තැනැත්තියක ලෙස සමාජගත වී තිබුණත් ඇය වර්තමානය වන විටත් රාජ්‍ය සංවර්ධන ක්‍රියාදාමය තුළ සැළකිය යුතු කාර්යභාරයක් ඉටු කරමින් සිටී. 'කාන්තාව පැරණි ඉන්දීය සමාජ පසුබිම තුළ සියලු සමාජ, ආර්ථික, ආගමික ක්ෂේත්‍ර කෙරෙහි හිමිකර ගන්නා ලද අවම වරප්‍රසාද ලාංකේය කාන්තාව විෂයෙහි එලෙසින්ම අත්පත් වූ බවට මූලාශ්‍රය සාධක නැත. විශේෂයෙන් ඉඩම් අධිකාරී බලය නැමති කාරණයේදී ඒ හා සම්බන්ධ සැළකිය යුතු බලයක් කාන්තා පාර්ශවය උරුමකරගෙන තිබේ. මහනුවර රාජධානී අවධියේ කාන්තාව ඉඩකඩම් සම්බන්ධයෙන් සැළකිය යුතු බලයක් හිමිකරගත් බවත්, ඉඩම් හිමි ප්‍රභූ පැලැන්තිය තුළ ඇය සැළකිය යුතු කාර්යයක් ඉටුකරන ලද බවත් මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ. තමා වෙත දේපළ පවරා ගැනීමටත්, තමා සතු දේපල පුද්ගල විෂයෙහි පමණක් නොව ආගමික ආයතනවලට පැවරීමටත්, ඉඩම් විකිණීමටත්, මිලදී ගැනීමටත් ස්වාධීන බලයක් කාන්තාව හිමිකරගත් අතර මහනුවර රාජධානි සමය වනවිට සංකීර්ණ ක්‍රියාදාමයක් බවට පත්වී තිබෙන ආකාරයක් ද දැකිය හැකි වේ. මහනුවර රාජධානී සමයේ කාන්තාව සතු වූ ඉඩම් අධිකාරී බලය පිළිබඳ ගම්පත්කඩ සහ පූජාපත්‍ර ඇසුරෙන් අධ්‍යයනය කිරීමක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. මහනුවර අවධියේදී කාන්තාව සතු වූ ඉඩම් අධිකාරී බලය පුරුෂ පාර්ශවයට හිමි ඉඩම් අධිකාරී බලය අභිබවායාමක් ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මහනුවර

රාජධානි සමයේ කාන්තාව සතු ඉඩම් අධිකාරී බලය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූ අතර ඉඩම් හා සම්බන්ධව මහනුවර අවධියේ කාන්තාව හිමිකරගත් බලය ස්වාධීන වූවක් ද?, එය පුරුෂයාට හිමි වූ තත්ත්වයට සමාන හෝ එය අභිබවායාමක් ද? යන්න විමසීම සෙසු අරමුණු වේ. මෙහිදී යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය යි. දත්ත සපයා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනය සිදු කෙරිණි. 17 වන සියවසේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන, යුගයට අදාළ සීට්ටු, ගම්පත්‍ර සහ පූජාපත්‍ර රැසක් අධ්‍යයනයට ලක්කොට ලබාගත් දත්ත සන්සන්දනාත්මකව සහ විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වෙයි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මහනුවර රාජධානි සමයේ ද පුරුෂයන්ට මෙන්ම කාන්තාවන්ට ද ඉඩම් භුක්ති අයිතිවාසිකම් සමව තිබූ බවට සැළකිය හැකි සාක්ෂ්‍ය දක්නට ලැබේ. මූලාශ්‍රයාගත සාධකවලට අනුව තමා වෙත දේපළ පවරා ගැනීමටත්, තමා සතු දේපළ පුද්ගල විෂයෙහි පමණක් නොව ආගමික ආයතනවලට පැවරීමටත්, ඉඩම් විකිණීමටත් මිළ දී ගැනීමටත් කාන්තාව සතුව පැවති අයිතිය හෙළිදරව් වේ. ක්‍රි. ව. 1795 දී පමණ අප්පුහාමි නැමැත්තා විසින් සිය මව වූ කිරිහාමිගෙන් ලද ඉඩකඩම් සිය දියණිය වන ටිකිරි එතනාටත්, මුණුබුරා වන අප්පුහාමිටත් භාරකාරත්වය පැවරීම පිළිබඳව තොරතුරු අනාවරණය වී තිබේ (ලෝරි, 2014). මෙම ඉඩම පවරා දීමේ දී ඉඩම් ප්‍රදානය ලබන ටිකිරි එතනාට කිසියම් නියෝගයකට යටත්ව සිය ප්‍රදානය භාර ගැනීමට සිදුව ඇත. එනම් පුත් අප්පුහාමි විසින් සිය මිත්තනියට උපකාරාදිය කළහොත් ගොලුවැද්දිය නම් කුඹුරු ඉඩමෙන් ලාස් 05 ක් ඔහුට පරවේණියට ලබාදිය යුතු බව ය. එකී නියෝගය කුමන ආකාරයේ එකක් වුවත් කාන්තාව සතු ඉඩම් භුක්තිය පිළිබඳව වැදගත් තොරතුරු රැසක් මින් පැන නැගේ. එනම් මෙම ඉඩම් අප්පුහාමිට ලැබෙන්නේ සිය මව වූ කිරිහාමිගෙනි. ඒ අනුව කිරිහාමි සතුව පැවති ඉඩම් අයිතිය හා පරපුරට අත්පත් කර දීමේ හැකියාව පිළිබඳව අදහසක් ගොඩනගා ගත හැකි වේ. ඊට අමතරව මෙම ඉඩම් සිය පුතුට ලබාදුන් පසු ඔහු විසින් මෙම ඉඩම් නැවතත් කාන්තාවක් අතට පත්කොට ඇත. එනම් සිය දියණිය වන ටිකිරි එතනාට ය. ඒ තුළින් සිය දියණියට පියාගෙන් ලද ඉඩම්හි අධිකාරීත්වයක් ගොඩනැඟී තිබේ. ඉඩම් හිමිවන්නේ භුක්තියට නොව අයිතියට ය. එමගින් කාන්තාව සතු ඉඩම් අයිතිය පිළිබඳව යම් අදහසක් ගොඩනගා ගත හැකි වේ.

රජරට සභ්‍යත්ව අවධියේ සිටම කාන්තාව විසින් හිමිකරගත් ඉඩම් බලය මහනුවර රාජධානි සමය වනවිට සංකීර්ණ ක්‍රියාදාමයක් බවට පත්වී තිබෙන ආකාරයක් ද දැකිය හැකි වේ. බරිගම රාළ විසින් තම මිණිබිරිය වූ පුංචි එතනාටත්, තම දියණිය වූ කිරිමැණිකාටත්, ඇගේ පුතුන් දෙපළටත් ඉඩම් පරිත්‍යාග කිරීම පිළිබඳව ක්‍රි.ව. 1814 ට අයත් ලේඛනයක සඳහන් කර තිබේ. මීට අමතරව උඩගබඩා නිලමේ පදවිය දරන්නා වූ දෙහිගම නවරත්න අතපත්තු වාසල මුදියන්සේ රාළහාමි විසින් සිය දේපළ පවරාදීමේ දී එම දේපළ පවරාගන්නා අයවලුන් අතර කාන්තාවක් ද වේ (ලෝරි, 2014). 'උඩගබඩා නිලමේ පදවිය කරවන දෙහිගම නවරත්න අතපත්තු වාසල මුදියන්සේ රාළහාමි විසින් යහපත් චේතනාවෙන් හා මෙලොව පරලොවහි පින් රැස්කිරීමේ පරමාධ්‍යාශයෙන් පොදුවේ භුක්ති විඳින ලද්දා වූ ගොඩමඩ දේපළ පවරා දෙනු ලබන වගනම්:- මා විසින් උඩුනුවර ගඟ පළාතේ මී වතුරේ පිහිටි අමේපමුල්ල තුන්පැල් පස් ලාහ පඩිකාර ලේකම් මහත්තයාට දී ඇත. මා විසින් යටිනුවර ගඟ පළාතේ ගනේගොඩ පිහිටි ගොඩ වැවල දෙ පැල් පස්ලාහඳ පඩිකාර ලේකම් මහත්තයාට දී ඇත. මා විසින් පෙර කියන ලද ගනේගොඩ පිහිටි වැල් දෙපැල ලොකු බණ්ඩාට දී ඇත. මා විසින් මහකුඹුර එක් පැල වෛරෝඩි මැණිකේට දී ඇත.... මා විසින් එකී රට උඩුවාවල පිහිටි මුකුන්දෙනිය පස් පැල සහ බෝතොට යායේ කුඹුර ලාස් දහසක් වලවේ කුමාරිහාමිට දී ඇත. මා විසින් ඌව දිසාවේ උඩුකිඳ ආසනයේ පිහිටි අලුත් හතළිස් තුනක වපසරිය ඇති ගොඩ මඩ හා ඊට අනුශාංගික සියල්ල පඩිකාර ලේකම් මහත්තයාටම දී ඇත්තේ ය. මා විසින් එසේම එම දිසාවන්ගේ පිහිටි උඩුබදන අමුණු හැත්තෑ පහක් හා ඊට අයත් සියලු ගොඩ මඩ ගේ දොර ගහකොළ ආදියත් වෛරෝඩි මැණිකේට දෙන ලදී. නුඹලා සියල්ලෝම පිරිමි දරුවන් හතරදෙනාම මගේ ආදරණීය ලේලිය වන මාගේ ඇසක් බඳු වූ දයාබර වූ වෛරෝඩි මැණිකේට මා ජීවත්ව සිටින කල්හි ඔබ මා හට උපකාර කරන්නේ යම් සේ ද එසේම උපකාර කළ යුතු වන්නේ ය. ඔබ උපකාර නොකරනු ලබන්නේ නම් වෛරෝඩි මැණිකේ වෙත මෙහි දෙනු ලබන්නා වූ ද දී ඇත්තා වූද දේපල ඔබ වෙතින් ආපසු ගැනීම වෛරෝඩි මැණිකේට බලය ලැබේ. සන්නස් තල්පත් ඉඩම් භාණ්ඩ සහ සියලු නිශ්චල හා චංචල දේපල ආපසු ලබාගැනීමට වෛරෝඩි මැණිකේට දයාන්විත භාවයෙන් යුතුව පළමුවත් දෙවනුවත්

තෙවනුවත් මින් බලය පවරනු ලැබේ. එසේම වැඩිමහල් පුත්‍රයා හෝ දෙවැනි පුත්‍රයා හෝ ඊළඟ පුත්‍රයාගේ බාල පුත්‍රයා වූ නුඹලා හෝ නුඹලාගේ දරුමුණුපුරන් හෝ එකී වෛරෝඩි මැණිකේට යම් අර්බුදයක් පැන නැගුව හොත් ඔවුන් සියල්ලෝම නරකාදියක වේවයි තුන්වරක් සාප කරමි. ඇය විසින් පංචශීල ගුනයෙන් බැදි දිවුරා සිටීමෙන් පසුව වෛරෝඩි මැණිකේට කිසිදු අනර්ථයක් නොවේවායි තුන්වන වරටත් ප්‍රකාශ කරමින් මෙම ප්‍රදානය කරන ලද්දෙමි. පිරිමි දරුවන් හතරදෙනාට මෙම ප්‍රදානය වෙනස් කරන්නට බෙදන්නට ගන්නට හෝ දෙන්නට කවරාකාර වූ අයිතිවාසිකමක් නැත්තේ ය. වෛරෝඩි මැණිකේට බලය ඇත්තේය......'

කාන්තාවන් කිහිප දෙනෙකුටත්, පිරිමි දරුවන් කිහිපදෙනෙකුටත් ඉඩම් ප්‍රදානය වී ඇති අතර වැඩිම ඉඩම් ප්‍රමාණයක් ප්‍රදානය වී ඇත්තේ වෛරෝඩි මැණිකේට ය. වෛරෝඩි මැණිකේ යනු දෙහිගම අතපත්තු වාසල මුදියන්සේ රාලහාමිගේ ලේලියයි. මෙකී ඉඩම් ප්‍රදානයේ දී වෛරෝඩි මැණිකේට ඉඩම් හා සම්බන්ධ කිසියම් අධිකාරී බලයක් ද පැවරී ඇති බව ලේඛනය තුළින් පෙනෙන්නට තිබේ. එනම් ඉඩම් ලද සියලු දෙනාම වෛරෝඩි මැණිකේට උපකාර කළ යුතු බවත් එසේ නොකළහොත් සියලු දේපල නැවත ලබා ගැනීමට වෛරෝඩි මැණිකේට බලය ඇති බව ය. එසේ ඉඩම් හා සම්බන්ධව ලබා දෙන ලද සන්නස්, තල්පත්, ඉඩම් භාණ්ඩ සහ නිශ්චල චංචල දේපල, ආපසු ලබා ගැනීමට වෛරෝඩි මැණිකේට තෙවරක් බලය ලබා දී තිබීමෙන් කාන්තාව සතුව ඉඩම් සම්බන්ධ අධිකාරී බලය පැහැදිලි වේ. එමෙන්ම මෙම ඉඩම් හා සම්බන්ධ ප්‍රදානය වෙනස් කරන්නට කිසිවෙකුට අයිතිය පවරා නැති අතරම එකී අයිතිය ද වෛරෝඩි මැණිකේ සතුව ඇත. මේ අනුව ප්‍රදානිත ඉඩම්වල ප්‍රදානයේ ස්වභාවය පවා වෙනස් කරන්නට කාන්තාවට බලය හිමි කර දී තිබුණු ආකාරය පිළිබඳව අදහසක් ගොඩනගා ගත හැකි වේ. මෙම තල්පතින් කාන්තාව සතු ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳව තවත් වැදගත් අදහස් රැසක් ඉදිරිපත් කරයි. තල්පතේ සඳහන් කරන ආකාරයට වාසල මුදියන්සේට සිය උරුමයෙන් ලැබුණේ ගන්නෝරුවේ අමුණු 03 ක් වූ මහකුඹුර සහ එක් පැලක් වූ කඩිති අංග වේ. මවගේ උරුමයෙන් උඩබැද්ද ගමේ බුළුවතුර පස් අමුණක් ද පුරන්වේ හත් අමුණක් ද කටුවේ කුඹුර හය පැලක් සහ උරුදවත්ත අමුණු පහක් විය. මේ අනුව මාපිය උරුමයෙන් ලද සම්පූර්ණ දේපළ ප්‍රමාණය අමුණු 20 යි පැල් 07 කි. මෙම ඉඩම්වලට තම සහෝදරයා හෝ ඔහුගේ දරුවන් ආරවුල් කළහොත් දේපළ දෙකට බෙදීමේ වරදෙක් නැත. එහෙත් උකස් කොට තිබී තමා විසින් බේරා ගන්නා ලද දේපළ, කුඹුරු වතුපිටිවල සියලු අයිතියත්, මහාවාසලෙන් හා රජයෙන් ලද කොටස් මෙන්ම දෙමාපිය උරුමයෙන් නිත්‍යානුකූලව ලැබෙන කොටස යන මේ සියලු දේපළවල අයිතිය වෛරෝඩි මැණිකේට අයිති විය යුතු ය. මේ අනුව සහෝදර පාර්ශවය අතර හුවමාරු වූ ඉඩකඩම් විෂයෙහි තිබූ අධිකාරී බලයට වඩා වැඩි අධිකාරී බලයක් ලේලිය වූ වෛරෝඩි මැණිකේට හිමි වූ තිබූ ආකාරය අවබෝධ කරගත හැකි වේ. මේ තුළින් සමකාලීන යුගයේ දී කාන්තාව සතුව ඉඩකඩම් විෂයෙහි පැවති අධිකාරත්වය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත හැකි ය.

මහනුවර යුගයේ දී පුරුෂයන්ට පමණක් නොව කාන්තාවන්ට ද ඉඩම් අයිතිවාසිකම් සමව තිබූ බවට සාක්ෂ්‍ය රැසක් යුගයට අදාළ මූලාශ්‍රය හඳුනාගත හැකි වේ. මූලාශ්‍රයාගත සාධකවලට අනුව සමකාලීන යුගයේ කාන්තාවන් යම් යම් අවස්ථාවල පුද්ගල විෂයෙහි පමණක් නොව ආගමික ආයතනවලට ද දේපළ පැවරීම් පිළිබඳ තොරතුරු ලබාගත හැකි වේ. එසේ ප්‍රදානය කිරීමට කාන්තාවන්ට හැකි වූයේ අනිවාර්යයෙන්ම ඔවුන් සතුව දේපල අධිකාරිය පැවති හෙයිනි. තංගලුයායේ පිහිටි 'කිල්තුට්ටන්දරේ කුඹුර' මුල දී කහදාවේ සෙනරත් මුදියන්සේ විසින් කදුරු පොකුණේ විහාරස්ථානයට පූජා කරන ලද අතර මෙය කටවචනයෙන් කළ පූජාවක් බැවින් මුදලිතුමාගේ අභාවයෙන් පසු එම ළමාතැනී විසින් පූජා පත්‍රයක් සහිත ව පූජා කිරීම පිළිබඳ ව කදුරුපොකුණේ විහාරස්ථානයට අයත් පූජා පත්‍රයක සඳහන් වී තිබේ (වනරතන, 2008) 'කහදාවේ සෙනරත් මුදියන්සේ විසින් ගිරුවා පත්තුව බද කහවත්තේ තානායමට අඩුත්තු තන්ගල්ල යන ගම හරියෙන් කපා සෑ දෙව් 'කිල්කුට්ටන්දරේ' යන මුලන තුරන් වී හතමුණේ වපසරිය සකල ජනානන්ද කරවූ කදුරු පොකුණේ විහාරස්ථානයට.... වර්ෂ හැටදෙකේ දී පූජා කරමි. සේන්දු කරගත් ඒ මුලන දූනට හතර අවුරුද්දක් මුළුල්ලෙහි ඔත්පින්නයක් නැතිව බුක්ති විඳගෙන එන ප්‍රස්තාවට වරක් කී මුදියන්සේ රාලහාමි කාලත්‍රයා වූ හෙයින් එම මුදියන්සේ රාළහාමියේ ළමා එතනි.... මා විසිනුත් පූජා කරමින්....' මෙහි සඳහන් ආකාරයට ඉඩම් ප්‍රදානය ලිඛිතව පූජා පත්‍රයක් සහිතව ස්ථාවර කිරීමේ හැකියාව ළමාතැනීට හිමිවූයේ ඉඩම සම්බන්ධව ඇය සතුව පැවති අධිකාරී බලය නිසා ය. ස්වාමිපුරුෂයාගේ මරණයෙන් පසුව ඉඩමේ නීත්‍යානුකූල අයිතිය බිරිඳ සතු වීම මහනුවර සම්ප්‍රදාය විය. එනිසාවෙනි ඇය ස්වාමියාගේ කටවචනයෙන් වූ පූජාවට නිත්‍යානුකූල භාවයක් ගෙන

දෙන්නේ. එනිසා මේ තුළින් සමකාලීන යුගයේ කාන්තාව සතුව පැවති ඉඩම් අධිකාරිය පිළිබඳව අදහසක් ගොඩනඟාගත හැකි වේ.

වඳ ස්ත්‍රියක් වූ ලොකු මැණිකේ විසින් ස්වකීය චංචල නිශ්චල දේපල ස්වකීය පුරුෂයාට ප්‍රාණ භුක්තියත්, උපකාර කරන සිය සොයුරියට අයිතියත් සහිත ව කළ ප්‍රදානයක් පිළිබඳ දක්වා තිබේ. ප්‍රාණ භුක්තිය යනුවෙන් මෙහි අදහස් වූයේ ස්වාමියා ජීවත්වන තාක්කල් ඉඩම භුක්ති විඳිය හැකි බව ය. එහෙත් සිය ස්වාමියාගේ මරණයෙන් අනතුරුව එකී ඉඩමේ සම්පූර්ණ අයිතිය සිය සොහොයුරියට හිමි වේ. තමාගෙන් පසු ඉඩමේ අයිතිකාරත්වයට දරුවන් නොසිටින විට සිය සහෝදරියට දේපල හිමිකාරත්වය පැවරීමට ලොකු මැණිකේට හැකියාව ලැබුණේ එම ඉඩම සම්බන්ධ නිරවුල් අයිතියක් ඇය සතු වූ නිසා ය. ඇරැපොල කෝරළේ මහත්මයා විසින් අනියම් බිරිඳකගේ දරුවකු ලෙස සිතිය හැකි ඩිංගිරි මැණිකාට සිය බූදලයෙන් කොටසක් වෙන් කිරීම පිළිබඳ ව හන්දුකන්ද කෝණාර රණසිංහ ගම්පත්කඩයෙහි ද දක්වා තිබේ (ඤාණවිමල, 1967). මෙහි සඳහන් ආකාරයට ඩිංගිරි මැණිකා ඇරැපොල කෝරලේ මහත්මයාගේ අනියම් බිරිඳකගේ දරුවෙකි. ඇය කිසියම් දිනක විවාපත් වුවහොත් ඇයට හිමි දෑවැද්ද ලෙස ලැබෙන්නේ බෝගහ කුඹුරෙන් පහලොල්ලාහක ප්‍රමාණයකි. එහෙත් ඇයට පෙළවාසියක් කර ගැනීමට නොහැකි වුවහොත් ඇරැපොල කෝරලේ මහත්මයාට හිමි සෑම ගම්වලින්ම කොටසක් ඇයට අයිතිවන බව ගම්පත්කඩයේ සඳහන් කොට තිබේ. මේ අනුව කාන්තාව ඉඩම් භුක්තිය විෂයෙහි ලබාගෙන සිටි තැන පිළිබඳ ව නිරවුල් අදහසකට එළඹීමේ හැකියාව පවතී.

උඩසියපත්තුවේ බැද්දේ දොරලියද්දේ ඉඩම් ගෙදර ජයතුහාමි විසින් තමාගේ ලේලිය වන ඩිංගිරි මැණිකාට ඉඩම් පවරා දීමක් පිළිබඳ ව ක්‍රි.ව. 1793 ට අයත් තල්පතක දක්වා තිබේ (Lawrie, 1896). හෙලගල්ලේ කුඹුර, බින්නේ කුඹුර, අංගේමුල්ලේ හේන, දිවුලේ හේන, කලුකැලේ හේන, ඊරියබේරේ හේන, අටුවගාව හේන, හියබලාගහමුල හේන, කළු කැලේ හේන, පින්නකැටිය හේන, ගලැඩපිටියේ හේන, වැවුල්බොන් හේන, මාරසිංහයලැතැන්නේ හේන, සහ වැවගාව හේන ආදී ඉඩම් ද, පිංචා ගම්මැහේට උපසත්කාර කිරීමෙන් ලත් ඉඩම් ද, ඉරුගල්හාමිගෙන් මිලට ගන්නා ලද හුනු කැට වලේ හේන ද, ලේලිය වන ඩිංගිරි මැණිකාට පවරා දී තිබේ. මෙම තල්පතින් පැන නැඟෙන වැදගත්ම කාරණය නම් යමෙකුට උපකාර කිරීමෙන්, සහ මිල දී ගැනීමෙන් ඉඩම් අයිතිය හිමිකර ගත හැකි වූ බව ය. මෙම සියලු ඉඩම් ප්‍රදානය වන්නේ කාන්තාවකට ය. එනිසා කාන්තාව ඉඩම් හා සම්බන්ධ අධිකාරී බලයක් හිමිකරගෙන තිබේ. ඩිංගිරි මැණිකා සතු ඉඩම්වලට කිසිවෙකුටවත් අවුලක්, උද්ධරණයක් කළ නොහැකි ය. මෙම ඉඩම් ඩිංගිරි මැණිකාට පරම්පරා අයිතියට හිමි කර දී ඇත. උඩුගම මැණික්රාළ විසින් ඔහුගේ බාල සහෝදරිය වන කිරිමැණිකා හට ඉඩකඩම් රැසක් පරිත්‍යාග කිරීම පිළිබඳ ව ක්‍රි.ව. 1797 වර්ෂයට අයත් ලේඛනයක සඳහන් වේ (Lawrie, 1896). මෙකී ප්‍රදානිත දේපළ අතර පොල්ගස් 9 කින්ද, කොස් ගස් හතරකින් ද, ගම්මිරිස්වැල් හයකින් ද, නුගේදෙණිය ලාස් 16 කින් ද, සමන්විත උඩගම්මැද්දේ ගෙදර වත්ත සහ ගෙදර වත්ත නැමැති ඉඩම ද වේ. මෙකී ඉඩම් උඩුගම මැණික්රාළ විසින් ඔහුගේ බාල නැඟනියට පරිත්‍යාග කරන්නේ අත ලෙව කෑමෙනි. මේ අනුව 'අත ලෙව කෑම' යනු ඉඩම් අයිතිය ලබා දීම පිළිබඳ ව සංකේතාත්මක නිරූපිතයක් විය හැකි ය. ඇතැම් විට කාන්තාවන්ට ඉඩම් ලබා දීමේ දී සම්මත ක්‍රමවේදයක් ලෙස මෙය භාවිත කළා ද විය හැකි ය. මංගලගම විත්ති පත්‍රයේ (බෙල්, 2004) සඳහන් කරන ආකාරයට ද ගල්ලත් නයිදේගේ පුත්‍රයා වූ මද්දුම නයිදේට මංගල ග්‍රාමය භාරකරන විට පුත්‍රයාගේ අත සිඹ දිවුරුම් පසක් ගත් බව කියයි. ඉන් කිසිදු නපුරක් පුත්‍රයාට සිදු නොවන බව ප්‍රත්‍යක්ෂ කිරීමෙන් පසු ඉඩම ලබා ගත් බව සඳහන් වීමෙන් පරම්පරා භුක්තිය වුව ලබා ගැනීමේ දී ඊළඟ පරපුරට අත්කර දීම පිළිබඳ ව කිසියම් චාරිත්‍රානුකූල සම්ප්‍රදායයක් පැවති බව හෙළිදරව් වෙයි.

**කාන්තාව සතු වූ ඉඩම් පැවරීමේ බලය**


මහනුවර රාජධානි සමයේ කාන්තාව සතු ඉඩම් භුක්තිය පිළිබඳව විමසීමේ දී කාන්තා අයිතියෙහි පැවති ඉඩම් තවත් කාන්තාවකට පැවරීම් පිළිබඳව නිදර්ශන රැසක් ලැබේ. වලගමගේ පුංචි එතනා විසින් තමා දිළිඳු තත්ත්වයට හා පීඩාවට පත්වීම නිසා තමා සන්තක ඉඩම් විමලධර්මසූරිය රජුගේ අන්තඃපුර කාන්තාවක වූ ඇටිපොල හේරත් මුදියන්සේලාගේ මිනිබිරියක වන අත්තරගම උන්නාන්සේට ප්‍රදානය කිරීම පිළිබඳ ව ලෝරි ගැසටියරයෙහි දක්වා තිබේ (ලෝරි, 2014). 'වලගමගේ පුංචි එතනා' යනු හේවාහැට අම්පිටියේ සමරතුංග දිසා මහත්මයා හදාවඩා ගනු ලැබූ කාන්තාවකි. ඇය අන්තඃපුර කාන්තාවකට ඉඩම් පරිත්‍යාග කළ බව කීමෙන් සමකාලීන සමයේ ඉඩම් හා සම්බන්ධව කාන්තාව සතු වූ අධිකාරී බලය පැහැදිලි වේ. කාන්තා ඉඩම් භුක්තිය හා අයිතිය පිළිබඳව සාකච්ඡා කරන විට

කාන්තාවකට තමා සන්තකයේ පැවති ඉඩම් පැවරීමත්, විකිණීමටත්, අන්සතු කිරීමටත්, අයිතිය තමා සතු කොට තබා භුක්තියට ලබා දීමටත් ස්වාධීන අයිතියක් පැවතුණු බව පෙනේ. විශේෂයෙන් ඉඩම් පැවරීමේ දී සිය ඥාතීන්ට හෝ තමා අභිමත ඕනෑම කෙනෙකුට පැවරීමේ අධිකාරීත්වයක් කාන්තාව සතු විය. බොකවෙලරාළගේ දියණිය වූ කිරිමැණිකා විසින් අවසාන දීමනාවක් වශයෙන් සිය මරණ මංචකයේ දී තමාගේ මිණිබිරිය වූ ඩිංගිරි මැණිකාට ප්‍රදානය කිරීමක් පිළිබඳ ව ක්‍රි.ව. 1721 ට අයත් ලේඛනයක දක්වා තිබේ (ලෝරී, 2014). කළුඑතනා විසින් තමාට අයිති ගොලහේනවත්තේවල එක් පැල ද, ඊට යාවූ ගොඩමඩ පළතුරු ආදිය ඇයගේ දියණියක් වන එතනාට ලබාදෙන්නේ පරවේනි භුක්තිය පිණිස ය (ලෝරී, 2014). තල්පතට අනුව ගුණරත්න එතනාට එම ඉඩම් ලබා දෙන්නේ අයිතියට නොව භුක්තියට ය. ඉඩම්වල අයිතිය කළු එතනා ළඟ තබා ගනිමින් ඉඩම් භුක්තියට පැවරීමක් සිදුව ඇති බව මින් පැහැදිලි වෙයි. ඉඩම් භුක්තියට මෙන්ම අයිතියට පවරන අවස්ථා පිළිබඳ ව යුගයට අදාළ තල්පත් මඟින් තොරතුරු අනාවරණය කර ගත හැකි වේ. ඉම්හාමිලාගේ ඩිංගිරිහාමි විසින් තමා මෙතෙක් භුක්ති විඳගෙන ආ ඉඩකඩම් සියල්ල මින් පසු තමාගේම දියණිය වන මැණික් එතනාට අයිතිවන බව ක්‍රි.ව. 1802 අයත් තල්පතක දක්වා තිබේ (ලෝරී, 2014). මෙසේ දියණියට ඉඩම් පවරන විට එහි සුරක්ෂිතතාව ද ඇති කරමින් ප්‍රදානය කළ ආකාරයක් දැකිය හැකි ය. 'මෙයට ආරවුල් හෝ බාධා කරන්නා වූ සියල්ලන් හට එකී මැණික් එතනා විසින් හතර දේවාලයේ සහ මහ කතරගම දේවාලයේ දී හත්වරක් දිවුරුම් ප්‍රකාශ කළ කල්හි ඉන් එකී මැණික් එතනා හැර අන්‍යයන්ට විපත් සැදේවා' මේ අනුව කාන්තාව සතු කරන ලද ඉඩම් අයිතිය කෙතරම් ප්‍රබලත්වයක් උරුම කර ගත්තේ ද යන්න වටහාගත හැකි ය. එය කිසිසේත් පුරුෂයන් සතු ඉඩම් අයිතියට හා භුක්තියට දෙවැනි වූයේ නැත.

හන්දුකන්දේ කෝණාර රණසිංහ ගම්පත්කඩයෙහි අනියම් බිරිඳකගේ දරුවාට එනම් ඩිංගිරිමැණිකාට සිය බූදලයෙන් කොටසක් වෙන් කිරීම පිළිබඳ ව සඳහන් කර තිබේ (ඥාණවිමල, 1942). එකී බූදලය අතරට කුඹුරු ඉඩමක් ද අයත් වී තිබේ. 'මා වෙනුවට උපන් ඩිංගිරි මැණිකාට පෙල වාසියක දුන්නෝතින් මට අයිති රණසින්හ මුදලි ගමෙන් බෝගහ කුඹුරෙන් වී පහලොල්ලහක හරිය දැවැද්ද පිණිස අයිතිකර දුන්නා ඇත.' මෙහි සඳහන් ආකාරයට ඩිංගිරි මැණිකා යනු ඇරැපොල කෝරලේ මහත්මයාගේ අනියම් බිරිඳකගේ දරුවෙකි. ඇයට හිමි දැවැද්ද වශයෙන් කුඹුරක් ප්‍රදානය කිරීම මෙහි සඳහන් කර ඇත. එහෙත් ඇය පෙලවාසියක දෙන්න බැරි වී ගමේම නැවතී සිටියොත් ඇරැපොල කෝරලේ මහත්මයාට අයිති සෑම ගම්වලින් කොටසක් ඇයට අයිති වේ. ඇගේ අනාගතය දීග, බින්න විවාහ ක්‍රම දෙකටම ඉඩ තබා එය සිදුවන ලෙස ස්වකීය දේපල අඩු වැඩි වශයෙන් අයිති වන්නට ලියා තැබීම නිසා මෙම පැරණි ලියවිල්ල සමකාලීන යුගයේ ඉඩම් භුක්තිය විෂයෙහි සුවිශේෂී ලියවිල්ලකි.

ප්‍රවේනි ඉඩම් බොහෝ විට පියාගෙන් පුතාට හිමි වීමේ සම්ප්‍රදායයක් දක්නට ලැබිණි. කිරිබමුණෝහිටිහාමිට අයත් මුඩු ඉඩම ඔහුගේ පුත් වන පුංචි අප්පුට පරවේනි අන්දමට භුක්ති විඳීම සඳහා ලබා දීම පිළිබඳ ව පරවේනි සීට්ටුවෙහි තොරතුරු දක්වා තිබේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් මඩුවන්වෙල වෙද මහ වාසලට පක්ෂපාතීකම් ඇතුව හොඳ හිතින් වැඩ රාජකාරිය කරන නිසා ඇරැපෝරුව ගම දරුමුනුබුරු වර්ග පරම්පරාව පවතනිතුරු ප්‍රවේනියට පවරා දීමක් පිළිබඳ ව ඇරුපෝරුව තඹ සන්නසේ දක්වා තිබේ (ඥාණවිමල, 1942). මේ අනුව ප්‍රවේනි ඉඩම් පියාගෙන් පුතාට වශයෙන් පරම්පරාවෙන් පරම්පරාවට උරුමවීමේ සම්ප්‍රදායක් පැවති බව අනාවරණය කරගත හැකි ය. එහෙත් මෙම තත්ත්වයට වෙනස් තත්ත්වයක් පිළිබඳව II වන රාජසිංහ රජුට අයත් මංගලගම විත්ති පත්‍රයේ දක්වා තිබේ. මංගලගම විත්ති පත්‍රයේ දැක්වෙන තොරතුරුවලට අනුව කෝට්ටේ හයවන බුවනෙකබාහු රජ දවස දඹදිවින් මෙරටට පැමිණෙන මුලාචාරී කෙනෙකුන් හට රජු විසින් මංගලගම ග්‍රාමය බඩවැඩිලි වශයෙන් ප්‍රදානය කර තිබේ (බෙල්, 2004). 'බඩවැඩිලි' යනුවෙන් මෙහි අදහස් කරන ලද්දේ ජීවිතය පවත්වා ගැනීම සඳහා ප්‍රදානිත ඉඩකඩම් ය. විදේශීයයකු සඳහා වන මෙම ගම් ඉඩම ප්‍රදානයෙන් පසු ඔහුට 'මණ්ඩලවල්ලි නයිදේ' යන නාමය පටබැඳී තිබේ. මණ්ඩලවල්ලි නයිදේ viii වන වීර පරාක්‍රමබාහු රජ දවස මිය යන විට මෙම ඉඩමේ හිමිකම සඳහා දරුවන් නොසිටීම ගැටලුවක් බවට පත්ව තිබේ. ඔහුගේ පරපුරෙන් පැවත එන කිසිවෙකු ඇත්දැයි රජු විසින් සොයන විට නැන්දණියන් හා බෑනණුවන් වන අනාථ දරුවන් දෙදෙනෙකු සිටිතැයි ප්‍රකාශ විය. රජුගේ අදහස වූයේ බෑනණුවන් හා නැන්දනිය විවාහ විය යුතු බව ය. මණ්ඩවල්ලි පරම්පරාවට හිමි දේපළ වෙනත් පරපුරකට හිමිවීම වළක්වා ලීම රජුගේ ප්‍රධාන අපේක්ෂාව වන්නට ඇත. මෙම විවාහයට ඔවුන් තදින් අකමැති වුවත් රජුගේ බලය හමුවේ අවසානයේ කැමැත්ත පළවී තිබේ.

මෙම විවාහයෙන් පසුව ඇයට මංගලගම ග්‍රාමය ප්‍රදානය වූ අතර ඇයට 'එතනා' යන නාමය ද ලැබිණි. එතනාගෙන් පසු මංගලගම ග්‍රාමයේ ප්‍රවේනිගත ඉඩම් භුක්තිය පහත සටහනින් දක්වා තිබේ




ඉහත සඳහන අනුව මංගලගම ග්‍රාමයේ ප්‍රවේනිගත ඉඩම් භුක්තියේ විකාශනය පිළිබඳ ව අවබෝධයක් ලද හැකි වේ. මංගලගම ග්‍රාමයට උරුමකම් කීමට වෙනත් ස්ත්‍රී පුරුෂ උරුමක්කාරයකු නොමැති බව සඳහන් කිරීමෙන් ප්‍රවේනිගත ඉඩම් භුක්තියෙහි ආරක්ෂිත බව අවබෝධ කරගත හැකි වේ.

**ප්‍රවේනි ඉඩම් කාන්තාව සතු වීමේ නෛතික ව්‍යූහය**

පරවේනි හෙවත් ප්‍රවේනි යන පදයෙන් මූලිකව අදහස් කරන ලද්දේ අභිමත පරිදි අවලංගු කළ හැකි නිලය වෙනුවෙන් ඉඩම් භුක්ති විඳීමේ ක්‍රමයට සම්පූර්ණයෙන් වෙනස් වූ දීර්ඝ කාලයක් තිස්සේ එක් පවුලකට අයත්ව පැවතියා වූත්, අන්සතු නොකරන ලද්දේ වී නම් පාරම්පරිකව උරුම වන්නා වූ අයිතියකි. එහෙත් මහනුවර යුගයේ ඉඩම් භුක්තිය තුළ මෙම තත්ත්වය අභියෝගයට ලක් වූ ආකාරය ඉහත දක්වන ලද විස්තරවලින් අවබෝධ කරගත හැකි වේ. පරවේනි පංගුවක් කාන්තාවක් සතු වූ විට එකී පංගුව බුක්ති විඳීම වෙනුවෙන් ඇය කළ යුතු සේවය වෙනුවට ඊට සමාන මුදලක් ගෙවීමට ඇයට අවසර ලබා දී තිබිණි (විහාරගම් දේවාලගම් හා නින්දගම් ඉඩම්වල බුක්තිය පිළිබඳ කොමිසමේ වාර්තාව, 1956, 12). එසේ නොවුණහොත් වෙනත් අයකු යොදවා සේවය ඉටුකර දීමට ඇයට හැකියාව පැවතිණි. විහාරගම්, දේවාලගම් හා නින්දගම් භුක්තිය පිළිබඳ කොමිසමේ වාර්තාව අනුව පරවේනි ඉඩම් පිරිමි දරුවෙකු නොවී නම් රාජසන්තක වූ බව දක්වා තිබේ (විහාරගම් දේවාලගම් හා නින්දගම් ඉඩම්වල බුක්තිය පිළිබඳ කොමිසමේ වාර්තාව, 1956, 12). සේවා පරවේණි ඉඩම් ලබා සිට මිය ගිය අයගේ පිරිමි දරුවන්ට පමණක් එම ඉඩම් උරුමකර ගැනීමේ අයිතිය ලැබෙන සේත් එබඳු පිරිමි උරුමකරුවකු නොමැති වූ විට හෝ බුක්තිය පිළිබඳ කොන්දේසි කඩන ලද කල්හි හෝ තම ඉඩම් රජුගේ ප්‍රයෝජනය උදෙසා ආපසු ලබා ගන්නා සේත් එම ව්‍යවස්ථාවෙන් ඉඩකඩ සලසා දී තිබේ (විහාරගම් දේවාලගම් හා නින්දගම් ඉඩම්වල බුක්තිය පිළිබඳ කොමිසමේ වාර්තාව, 1956, 12). 1809 වර්ෂයේ අංක 08 දරණ ව්‍යවස්ථා ප්‍රකාර මෙම නීතිය අසාධාරණ නීතියකැයි අර්ථ දැක්විය හැකි අතර ඉඩම් ප්‍රදාන ලබාදුන් ක්‍රමවේද මත සමහරක් ඉඩම්වලට පිරිමි උරුමකරුවකු නොමැති විට එය රජයට අයත්ව ඇත. තවත් ඉඩම් පරවේණි ක්‍රමය යටතේ කාන්තාවට හිමි වන්නට ඇත. එසේ සිතිය හැකි වන්නේ ඇතැම් කාන්තාවන්ට විවිධ සේවාවන් නියම වී තිබූ නිසාත්, එකී සේවාවන් ඉටු කිරීමට පරවේනි ඉඩම් ලැබී තිබූ නිසාත් ය. උදාහරණ වශයෙන් ආලත්ති සේවය දැක්විය හැකි අතර ආලත්ති අම්මාවරුන් කරන ලද සේවය වෙනුවෙන් මහනුවර යුගයේ දී ඉඩම් ලබා දී තිබුණි. ඒ අනුව එම ඉඩම් පරවේනි ආකාරයට උරුම වී නොතිබුණායැයි සිතීම ද අපහසු ය. ලෝරිගේ ගැසටිය තුළින් ද කාන්තාව සන්තක වූ ඉඩම් භුක්තිය පිළිබඳ ව වැදගත් තොරතුරු රැසක් අනාවරණය වේ. වරෙක පිළිමතලව්වේ විසින් තුවක්කු 02 ක් සැපයිය යුතු යැයි ඉල්ලා සිටි අවස්ථාවේ දී එය ඉටු කිරීමට නොහැකි වූ කාන්තාවකගෙන් යුධ රාජකාරිය වෙනුවෙන් ප්‍රවේනි උරුමයට ලබා දී තිබූ ඉඩම මාතර විජේසිංහ මුදලි වෙත ලබා දීම නිදසුන් ලෙස දැක්විය හැකි ය. ඒ අනුව කාන්තාව සතුව පවා ප්‍රවේනි ඉඩම් භුක්තිය ක්‍රියාකාරී වූ බව අවබෝධ කරගත හැකි වේ.


**ඉඩම් නඩු සහ කාන්තාව**

කාන්තාව සන්තක ඉඩම් පරම්පරාගතව පැමිණෙන විට එම ආරවුල් පැන නැඟෙන අවස්ථාත්, නෛතික ක්‍රියාමාර්ග මගින් ඒවා නිරවුල් අයිතියට හා භුක්තියට යටත් කිරීම පිළිබඳවත් තොරතුරු මහනුවර යුගයට අයත් සීට්ටු මඟින් ලැබේ. ක්‍රි.ව. 1798 ට අයත් සීට්ටුවක (ලෝරී, 2014) දෙහිදෙණියේ පිටියගේ හේරත්හාමි විසින් කාන්තාවන් කිහිප දෙනෙකුට සිදු කරන ලද ඉඩම් ප්‍රදානය නඩුවක් දක්වා ගමන් කළ ආකාරය දක්නට ලැබේ. 'දුම්බර තුම්පනේ නාරන්වැනි පළාතේ දෙහිදෙණියේ පිටියගේ හේරහාමිගේ පරම්පරා උරුමය පැවති දෙහිදෙණියේ කුඹුර නැමැති අමුණු එකකින් පහළ දෙපැල හේරත්හාමි විසින් ඔහුගේ දූවරුන් වූ මැණික් එතනා

සහ එතනාට ද ඉහළ දෙපැල ඔහුගේ දියණිය වූ වත්තුහාමි එතනාට ද දෙන ලදී. පසුකාලයක වත්තුහාමි එතනාගේ උරුමක්කාර හේනේපොල මොහොට්ටාල මැණික් එතනාගේ උරුමක්කාර ඇටඹේගොඩ ආරච්චිල සහ එතනාගේ උරුමක්කාර වනිසුන්දර ආරච්චිල අතර පහළ වී දෙපැල පිළිබඳ ව ආරවුලක් හටගෙන නඩු මාර්ගයට පිවිසියේ ය. එකී කාරණය යථා පරිදි විමසීමේදී හේනේ පොල මොහොට්ටාල විසින් වත්තුහාමි එතනාගේ පුත් වූ මාකිලිහාමි විසින් තල්පත් මගින් ඔහුගේ බෑණා වූ කුමුදුහාමිට දෙහිදෙනිය කුඹුර එක් අමුණක දෙනලද බව කියන ලදුව එය සත්‍යය ද අසත්‍යය ද විමසීමේදී එකී තල්පත වංචනික බවත් 'දෙපැල' යන්න 'අමුණ'ලෙස වෙනස්කර ඇති බවත් මැණික් එතනා හා එතනාගේ පරම්පරා පහක් මුළුල්ලේ පහළ දෙපැල දෙපැලක් වශයෙන් පැවති බවත් එකී තල්පත ගම්සභාවට භාරගන්නාලදුව පහල දෙපැල ඇටඹේගොඩ ආරච්චිල විසින් සාමකාමීව භුක්ති විඳිය යුතු බව ප්‍රකාශ කරන ලදී'

විශේෂයෙන් මහනුවර යුගයේ කාන්තාවගේ ඉඩම් අධිකාරී බලය සම්බන්ධයෙන් පැන නැංවෙන විශේෂම තත්ත්වය නම් විවාහය නැමැති සාධකය අභිබවා ගොස් අනියම් බිරින්දෑවරුන්ට පවා ඉඩමේ අයිතිය හා භුක්තිය ස්ථාවර කොට දී තිබීම යි. ස්වාමියාගේ අභාවයෙන් පසු බිරිඳට ඉඩම් හිමිවීම සාමාන්‍ය සම්ප්‍රදාය වුවත් තම අනියම් බිරිඳ හා දරුවන්ට ඉඩම්වලින් කොටසක අයිතිකාරත්වය පවරා දී තිබෙන අවස්ථා මහනුවර යුගයේදී හඳුනාගත හැකි විය. ඇරැපොල කෝරලේ මහත්මයා විසින් අනියම් බිරිඳකගේ දරුවකු ලෙස සිතිය හැකි ඩිංගිරි මැණිකාට සිය බූදලයෙන් කොටසක් වෙන් කිරීම පිළිබඳ හන්දුකන්ද කෝණාර රණසිංහ ගම්පත්කඩයෙහි දක්වා තිබීම නිදර්ශන වේ. එහි සඳහන් ආකාරයට ඇය කිසියම් දිනක විවාපත් වුවහොත් ඇයට හිමි දෑවැද්ද ලෙස බෝගහ කුඹුරෙන් පහලොල්ලාහක ප්‍රමාණයක් ලැබෙන අතර ඇයට පෙළවාසියක් කරගැනීමට නොහැකි වුවහොත් ඇරැපොල කෝරලේ මහත්මයාට අයිති සෑම ගමකින්ම කොටසක් ඇයට හිමිවන බව දක්වා තිබේ. ඒ නිසා විවාහය නැමැති සාධකය ඉක්මවා ගොස් අනියම් බිරින්දෑවරුන්ගේ දරුවන්ට පවා සාධාරණය ඉටු වන පරිදි ඉඩම් භුක්තිය හසුරුවාගත් ආකාරය සුවිශේෂ තත්ත්වයකි.

ක්‍රි.ව. 1798 ට අයත් සීට්ටුවක දෙහිදෙණියේ පිටියගේ හේරත්හාමි විසින් කාන්තාවන් කිහිපදෙනෙකුට සිදු කරන ලද ඉඩම් ප්‍රදානය නඩුවක් දක්වා ගමන් කළ ආකාරය දක්නට ලැබේ.




රූපය 01: දෙහිදෙණියේ පිටියගේ හේරත්හාමි තම ඉඩම් දියණියන් තිදෙනාට බෙදා දුන් ආකාරය හා එහි පරම්පරාගත භුක්තිය

දෙහිදෙණියේ පිටියගේ හේරත්හාමිට අයත් ඉඩකඩම්වල අයිතිකාරිත්වය හිමි තුන්වන පුරුක වන ඇටඹේගොඩ ආරච්චිල, වන්නිසුන්දර ආරච්චිල හා හේනේපොල මොහොට්ටාල යන තිදෙනා අතර ඉඩම් පහළ වී දෙපැල සම්බන්ධ ආරවුලක් පැන නැගෙන බව තල්පතේ සඳහන් ය. හේනේපොල මොහොට්ටාල විසින් දිගින් දිගටම කියා සිටියේ වත්තුහාමි එතනාගේ පුත් වු මාකිලිහාමි විසින් ඔහුගේ බෑනා වූ කුමුදුහාමිට තල්පතක් මඟින් දෙහිදෙණිය කුඹුර එක් අමුණක් දෙන ලද බව ය. මෙහි සත්‍ය අසත්‍යතාව විමසීමේ දී පැහැදිලි වූයේ එම තල්පත වංචනික බව ය. 'දෙපැල' යන්න 'අමුණු' ලෙස වෙනස්කර ඇති බවත්, මැණික් එතනා සහ එතනාගේ පරම්පරා පහක් මුළුල්ලේ පහල දෙපැල 'දෙපැලක්' වශයෙන් පැවති බව ය. ව්‍යාජ තල්පත ගම් සභාවට භාරගන්නා ලදුව පහල දෙපැල ඇටඹේගොඩ ආරච්චිල විසින් සාමකාමීව භුක්ති විඳින ලදී. මේ අනුව පැහැදිලි වන්නේ කාන්තාව සතු ඉඩම් අයිතිය කෙරෙහි පවා අභියෝග එල්ල වූ ආකාරය යි. ඇය සතු ඉඩම් සම්බන්ධයෙන් ව්‍යාජ ලේඛන සකස් වන විට නීතිය මගින් සාධාරණය ඉටු කරගත් ආකාරය මේ අනුව පැහැදිලිව අධ්‍යයනය කළ හැකි වේ.

## නිගමන සහ නිර්දේශ

ඉහත සඳහන් කරුණු අනුව මහනුවර යුගයේ කාන්තාව ඉඩම් අයිතිය සහ භුක්තිය විෂයෙහි සැළකිය යුතු තරමේ අධිකාරී බලයක් හිමිකරගත් බව පැහැදිලි වේ. ඇතැම් විට එම බලය පුරුෂ පාර්ශවයට හිමි ඉඩම් අධිකාරී බලයට පවා අභියෝග කළ අතර නඩුමගට බැසීමෙන් පවා ඇය ඉඩම හා සම්බන්ධ

ස්ථාවරය ඒ අයුරින්ම රැකගැනීමට සමත් වී තිබේ. ඒ අනුව මහනුවර රාජධානි සමයේ කාන්තාව සතු ඉඩම් අධිකාරී බලයට අභියෝග කිරීම පවා කළ නොහැක්කක් වූ බව පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (1967).*සපරගමු දර්ශන.* ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. (1942). *සපරගමුවේ පැරණි ලියවිලි.* මානවහිතවාදී ලේඛක පර්ෂදය. නුගේගොඩ.

බෙල්, එච්.සී.පී.,(2004). *ලංකා පුරාවිද්‍යා ගවේෂණය, සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව.* කේ.බී.ඒ.එඩ්මන්ඩ් (පරි.). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. කොළඹ. 2004.

ලෝරි, සී. (2014). *ලෝරි ගැසටියර්.* උපාලි ජී. කිරිදීගොඩ (පරි.). මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව. මහනුවර

වනරතන හිමි, කඹුරුපිටියේ, (2008), *රුහුණේ පැරණි අත්ලිපි*, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

*විහාරගම් දේවාලගම් හා නින්දගම් ඉඩම්වල බුක්තිය පිළිබඳ කොමිසමේ වාර්තාව*, 1956.

Ranawella, G.S. (2004) *Inscriptions of Ceylon.* Vol. V. Colombo: Department of Archaeology.

Ranawella, G.S.(2007) *Inscriptions of Ceylon.* Vol. VI. Colombo: Department of Archaeology.

Lawrie, A.C., (1896) *A Gazetteer of the Central Province of Ceylon,* Vol I, George J.A. Skeen, Government Printer, Colombo.